සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/03/18 - අ.ව. | ඔබේ අංකය<br>உமது இல<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2018.04.25 |

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ
අංක - සබර/2018/01

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සබරගමුව පළාතේ,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/විෂය අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කලාප අධ්‍යාපන කාර්යාලවල සියළුම ගණකාධිකාරීවරුන්,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>සම්පත්දායක දීමනා සංශෝධනය කිරීම.</u>**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST/7/EXAMS/05/1007-6 හා 2017.04.27 දිනැති ලිපිය මගින් අනුමත කර ඇති සියළුම දීමනා ප්‍රමාණයන් මෙම පළාතට බලාත්මක කර ගැනීම, **"අධ්‍යාපන අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන්හි කාර්ය සාධනය සඳහා විවිධ ගෙවීම"** මැයෙන් යුතු සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක GS/ES/7/3/9/V හා 2018.01.25 දිනැති ලිපිය මගින් අනුමත කර ඇත.

02. ඒ අනුව, **2017.09.11** දිනැති අංක **සබර/2017/07** දරණ චක්‍රලේඛයේ සඳහන් රේටයන් මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම චක්‍රලේඛයේ සඳහන් සෙසු කොන්දේසි හා නියමයන් තවදුරටත් නොවෙනස්ව පවතී. **<u>මින් ඉදිරියට සම්පත්දායක දීමනා ගෙවීමේදී</u>** පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, වගු අංක 01හි සඳහන් දීමනා ප්‍රමාණයන් ගෙවීමට කටයුතු කල යුතුය.

I. දීමනා ගෙවීම දිනකට පැය 3 ක උපරිම දේශන කාලයකට සීමා විය යුතුය. විශ්‍රාමික නිලධරයන් සඳහා දිනකට උපරිම පැය 6ක දේශන සීමාවක් අදාල කර ගත හැකිය.

II. දේශන සඳහා නිලධරයන් යොදා ගැනීමේදී අදාල ආයතන ප්‍රධානියාගේ අවසරය මත ඔහුගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන ලෙස යොදා ගත යුතුය.

III. ඉහත සඳහන් පරිදි පැයකට ගෙවනු ලබන සම්පත්දායක දීමනාවට අමතරව පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ විධිවිධාන අනුව සැතපුම් කුලී ගෙවීම

   i. රජයේ නිල වාහනයක් භාවිතා කරන්නේ නම් සැතපුම් කුලිය නොගෙවිය යුතු අතර, ඒ සඳහා අතිරේක ඉන්ධන ලබාදිය හැකිය.

   ii. පෞද්ගලික වාහනයක් භාවිතා කරන්නේ නම් සැතපුම් කුලිය ගෙවිය යුතුය.

*වගු අංක **1***

| කාණ්ඩය | සම්පත්දායකයින් | අනුමත දීමනා (පැයකට) |
|---|---|---|
| I | I. පිළිගත් විශ්ව විද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/ මහාචාර්යවරුන් (සේවා නියුක්ත හා විශ්‍රාමික) | රු.1500/= |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් (සේවා නියුක්ත හා විශ්‍රාමික) | |
| | III. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ C 2-1, C 2-2, C 2-3 සේවා ගණවල නිලධාරීන් | |

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042
අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com
කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

| | | |
|---|---|---|
| II | I. පිළිගත් විශ්ව විද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (සේවා නියුක්ත හා විශ්‍රාමික) | රු. 1300/= |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල I වන ශ්‍රේණියේ නිලධාරීන් (සේවා නියුක්ත හා විශ්‍රාමික) | |
| | III. ගුරු අධ්‍යාපනඥ සේවයේ I වන පන්තියේ නිලධාරීන් (සේවා නියුක්ත හා විශ්‍රාමික) | |
| | IV. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ C 1-1, C 1-2, හා C 1-3, AR 2 සේවා ගණවල නිලධාරීන් | |
| III | I. පිළිගත් විශ්ව විද්‍යාලයක කථිකාචාර්යවරුන් | රු. 1200/= |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල II ශ්‍රේණියේ නිලධාරීන් | |
| | III. ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන පන්තියේ නිලධාරීන් | |
| | IV. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මධ්‍යම කළමනාකාර මට්ටමේ C 2 හා C 3 සේවා ගණවල නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ පර්යේෂණ සේවා ගණයේ AR – 2 ඛණ්ඩයේ වැටුප් ලබන්නන් | |
| IV | I. පිළිගත් විශ්ව විද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරුන් | රු. 1000/= |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල III ශ්‍රේණියේ නිලධාරීන් | |
| | III. ගුරු අධ්‍යාපනඥ සේවයේ III පන්තියේ නිලධාරීන් | |
| | IV. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මධ්‍යම කළමනාකාර මට්ටමේ C 1 හා අධ්‍යයන/ පර්යේෂණ සේවා ගණයේ AR – 1 ඛණ්ඩයේ වැටුප් ලබන්නන් | |
| | V. පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් (පෞද්ගලික අංශයේ සේවයේ නියුතු) | |
| V | I. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I/II/III ශ්‍රේණිවල නිලධාරීන් | රු. 900/= |
| | II. ශ්‍රී ලංකා ගුරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් | |
| | III. ගුරු උපදේශකවරුන් | |
| | IV. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් | |
| | V. කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ නිලධාරීන් | |
| VI | I. අනෙකුත් සුදුසුකම් සහිත නිලධාරීන් | රු. 800/= |

මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/කලාප කාර්යලයේ/කොට්ඨාස කාර්යාලයේ සියළුම නිලධාරීන්/විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස තවදුරටත් දන්වා සිටිමි.

මහින්ද එස්. වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

* Ministry of Provincial Education *
Sabaragamuwa